# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

**PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS**

2018.07.30

ගරු කථානායක තුමා,

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,

ශ්‍රී ජයවර්ධන පුර,

කෝට්ටේ.

ගරු කථානායක තුමනි,

<u>**පළාත් සභා සීමා නිර්ණ වාර්තාව සමාලෝචන කමිටුව පත් කිරීම**</u>

පළාත් සභා මැතිවරණ ප්‍රමාද වීතමට බලපා ඇති ප්‍රධානතම තාක්ෂණික ගැටළුව බවට පත් වී ඇති සීමා නිර්ණ වාර්තාව සමාලෝචනය කිරීම සඳහා පනතට අනුකූලව කමිටුවක් පත් කිරීමට කටයුතු කිරීම පිළිබඳව පැෆ්රල් සංවිධානයේ ස්තූතිය පළ කරමු.

එහෙත් එම කමිටුව පත් කිරීමට අදාළ පහත සඳහන් කරුණු කෙරෙහි ඔබ තුමාගේ කාරුණික අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමු.

1. සීමා නිර්ණ කමිටුවේ සභාපති වරයා සමාලෝචන කමිටුව පත් කිරීම.
   ජාතික සීමා නිර්ණය කමිටුවේ සභාපති වරයා පළාත් සභා සීමා නිර්ණය කමිටුවේ ද සභාපති වරයා ලෙස ක්‍රියා කළ බැවින් ඔහු විසින්ම සකස් කළ වාර්තාව සමාලෝචනය කිරීම සඳහා එතුමන් නැවත පත් කිරීම කෙතරම් දුරට යෝග්‍ය දැයි නැවත සළකා බලන ලෙස ඉල්ලමි.
2. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති වරයා සමාලෝචන කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත් කිරීම.
   මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ එම කොමිෂම, පාර්ලිමේන්තුව විසින් සම්මත කරන නීතියට අනුව මැතිවරණ නිදහස් හා සාධාරණව <u>**ක්‍රියාත්මක කළ යුතු බලධාරියා වන**</u> බැවින් ඔහුද එම කමිටුවට පත් කිරීම පිළිබඳව නැවත සළකා බලන ලෙස ඉල්ලමි.

# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2514441 / 11 2514442 Fax: (+94) 11 2514443
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk

එමෙන්ම එම දෙදෙනාගේම දැනුම කමිටු සාමාජිකත්වයෙන් තොරව තාක්ෂණික මට්ටමින් ලබා ගැනීම සුදුසු බවද යෝජනා කරමු.

3. සීමා නිර්ණ වාර්තාව පිළිබඳ වතු ප්‍රදේශ නියෝජනය කරන දේශපාලන පක්ෂවලට විවේචනයක් හා උනන්දුවක් පවතින බැවින් එම පක්ෂ නියෝජනය කිරීම සඳහා ද නියෝජිතයෙකු නම් කිරීම සුදුසු බව යෝජනා කරමු.
4.

පළාත් සභා මැතිවරණය කඩිනමින් පැවැත්වීම සඳහා ඔබ තුමා කථානායක වරයා ලෙසත්, පෞද්ගලිකවත් දරන උනන්දුව බෙහෙවින් අගය කරන අතර මෙම කමිටුව ඉතා කෙටි කලකින් මෙම සමාලෝචනය අවසන් කර මැතිවරණ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සකසනු ඇතැයිද අපි බලාපොරොත්තු වෙමු.

ස්තුතියි.

මෙයට විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි,

විධායක අධ්‍යක්ෂ.

පිටපත - මැතිවරණ කොමිෂන් සභාව

උනන්දුවක් දක්වන සෙසු ආයතන